# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය
கிராமப்புற மேம்பாடு , சமூக பாதுகாப்பு மற்றும் சமூக அதிகாரமளித்தல்
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/BR/05 | ඔබේ අංකය / உமது இல / Your No: ........................ | දිනය / திகதி / Date: 2024.11.27 |

සියළුම සමෘද්ධි ප්‍රජා මූල බැංකු කළමනාකරුවන් හා

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන් වෙත.

**<u>2025 වසර සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල ලියාපදිංචිය අළුත් කිරීම, වාර්ෂික මහ සභා පැවත්වීම හා නිලවරණ පැවත්වීමේ කටයුතු පිළිබඳ.</u>**

වාර්ෂිකව සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල ලියාපදිංචිය අළුත් කිරීම සම්බන්ධව උපදෙස් ලබාදුන් ඉහත සමාංක දරණ 2023.11.08 දිනැති ලිපිය හා බැඳේ. එම ලිපිය මගින් 2024 වර්ෂයට අදාලව සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචිය අළුත් කිරීමට අදාල උපදෙස් ලබාදී ඇත.

02. 2017 මාර්තු මස 07 දින නිකුත් කල 2009/08 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග ප්‍රකාරව සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සෑම වසරකම මාර්තු 31 දිනට යටත් පිරිසයින් දින 30 කට ප්‍රථම (නියෝග අංක 5(6) යටතේ) ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ලියාපදිංචිය අළුත් කළ යුතුය.

03. එනමුත් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල වාර්ෂික මහසභා රැස්වීම් පැවැත්වීම හා නිලවරණ පැවැත්වීම 2025 පෙබරවාරි මස 15 දිනට ප්‍රථම පැවැත්විය යුතු බව ප්‍රධාන කාර්යාලයේ ප්‍රජාමූල අංශය තීරණය කර ඇත.

04. ඒ අනුව, ඔබ විසින් 2025 වර්ෂය සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකුව/ බැංකු සමිතිය ලියාපදිංචිය අළුත් කිරීම සඳහා වන අයදුම්පත් **<u>2025 මාර්තු මස 31 දිනට පෙර යොමු කල යුතුවේ.</u>**

05. පෙර වසරවල මෙන් සමෘද්ධි බැංකු හා බැංකු සමිති ලියාපදිංචියට අදාල මුදල (රු.1000/-) සමෘද්ධි බැංකු සමිතිය මගින් රැස්කර **එක් චෙක්පතක්** මගින්, "කළමනාකරු ලංකා බැංකුව, බත්තරමුල්ල සමෘද්ධි ප්‍රජාමූල බැංකු අංශයේ ආයෝජන ගිණුම" ජංගම ගිණුම් අංක 3417925 ට බැර වන සේ ලියා දින 60 කට වලංගු වන පරිදි සටහන් තබා ලියාපදිංචි අයදුම්පත් සමඟ යොමු කළ යුතු වේ.

06. ලියාපදිංචිය අළුත් කිරීමට අදාල අයදුම් පත්‍රය, ප්‍රජාමූල සංවිධාන තොරතුරු, මහ සභා හා පාලක මණ්ඩල තොරතුරු, මූල්‍ය තත්ත්ව විස්තර හා අදායම් ප්‍රකාශ තොරතුරු වල ආකෘති පත්‍ර පසුගිය වසරේ ආකෘති පරිදිම වන අතර, (2017 මාර්තු මස 07 දින අංක 2009/08 ගැසට් පත්‍රයේ මෙම ආකෘති සියල්ල ඇතුලත්ව තිබේ), ප්‍රජාමූල සංවිධාන තොරතුරු නැවත ඉදිරිපත් කිරීමේදී සංශෝධිත තොරතුරු පමණක් යොමු කිරීම ප්‍රමාණවත් වේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramull**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

07. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතියට පාලක මණ්ඩලය හා විධායක කමිටුව පත් කිරීමේ උපදෙස් අංක ස/ප්‍ර/බැ/2017/06 හා 2017.03.17 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි වේ.

08. නිලවරණය නොපැවැත්වීමේ හේතුව මත සමෘද්ධි බැංකු බැංකු සමිති ලියාපදිංචිය අලුත් කිරිම සඳහා වන අයදුම්පත්‍ර යොමු කිරිම ප්‍රමාද නොකළ යුතුය.

09. වාර්ෂික මහ සභා රැස්වීම් හා නිලවරණ නියමිත පරිදි පවත්වා නව නිලධාරී මණ්ඩලයක් පත් කර ගත යුතු වේ. මෙම වාර්ෂික මහ සභා පැවැත්වීමේදී එක් අයෙකුට උපරිම රු. 500/- කට යටත්ව සංග්‍රහ වියදම් හා අනෙකුත් වියදම් සමෘද්ධි බැංකු/ බැංකු සමිති මඟින් දැරිය හැකි වේ.

10. ඉහත උපදෙස් අනුගමනය කරමින්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වල 2025 වසරට අදාල ලියාපදිංචිය අළුත් කිරීමේ අයදුම් පත්‍ර යොමු කරන ලෙස කාරුණිකව දන්වන අතර බල ප්‍රදේශය තුල නියෝග ප්‍රකාරව නියමිත දින වකවානු තුල සමෘද්ධි බැංකු හා බැංකු සමිති ලියාපදිංචි කිරිමේ **වගකීම සමෘද්ධි බැංකු සමිති කළමනාකරු සතු වන බවද දන්වමි.**

11. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල සභාපතිවරුන්ගේ නිලකාලය අනුයාත වසර දෙකක කාලයකට පමණක් වලංගු වන බව එනම්, අඛණ්ඩව වසර දෙකකට වඩා පාලක මණ්ඩලයේ හෝ විධායක කමිටුවේ සභාපති ධූරයට පත් කිරීම නොකල යුතු බවත් වයස අවුරුදු 70ට නොවැඩි පුද්ගලයින් පත්කළ යුතු බවත් දැනුම් දෙන අතර ඇමුණුම අංක 01 හි සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර නිවැරදිව ලියාපදිංචියට අදාල අයදුම්පත්‍රය යොමු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව සඳහන් කරන අතර මෙම ලියාපදිංචි කටයුතු පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යවේ නම් දුරකථන අංක 0112887489 අමතන ලෙසද වැඩිදුරටත් කාරුණිකව සඳහන් කරමි.

සි.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය - දැ.ගැ.ස
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - දැ.ගැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස.
5. නීති නිලධාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස හා අ.ක.ස
6. ගරු සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහ සංගමය. - දැ.ගැ.ස හා අ.ක.ස.

ඇමුණුම 01

| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ලියාපදිංචිය | සමෘද්ධි ප්‍රජාමූල බැංකු ලියාපදිංචිය |
|---|---|
| අයදුම්පතේ සභාපති, කළමණාකරු දෙදෙනාම දිනය, නම, අත්සන, නිල මුද්‍රාව තැබිය යුතුය. ප්‍රාදේශීය ලේකම් හෝ මූලස්ථාන කළමනාකරු තොරතුරු නිවැරදි බව සහතික කළ යුතුය. | අයදුම්පතේ සභාපති, කළමනාකරු, බැංකු සමිති කළමණාකරු, දිනය, නම, අත්සන, නිල මුද්‍රාව තැබිය යුතුය. |
| විධායක කමිටු නාම ලේඛනයේ සභාපති, කළමණාකරුගේ නම, අත්සන නිල මුද්‍රාව තැබිය යුතුය. | පාලක මණ්ඩල මහා සභා රැස්වීම් වාර්තාවේ සභාපති, කළමනාකරු, දිනය, නම, අත්සන, නිල මුද්‍රාව තැබිය යුතුය. |
| මූල්‍ය තත්ව ප්‍රකාශය හා ආදායම් වාර්තාවේද සභාපති, කළමනාකරු දිනය, නම, අත්සන, නිල මුද්‍රාව තැබිය යුතු දිනය | මූල්‍ය තත්ව ප්‍රකාශය හා ආදායම් වාර්තාවේද සභාපති, කළමනාකරු දිනය, නම, අත්සන, නිල මුද්‍රාව තැබිය යුතු දිනය |
| මහා සභා රැස්වීම් වාර්තාවේ සභාපති හා ලේකම් අත්සන් කළ සහතික කළ පිටපතක් | මහා සභා රැස්වීම් වාර්තාවේ සහතික කළ පිටපතක් |